# ආගමික හා දර්ශනික චින්තාවන්ගේ පසුබිම

විමල භික්ෂු

ආගමික හා දර්ශනික චින්තාවන්ගේ සම්භවය පිළිබඳ කරුණු සෙවීමට යෑම අවුල් වී ගිය නූල් පන්දුවක මුල සෙවීමට අඳුරේ අතපත ගෑම වැනි ක්‍රියාවකි. එහෙත් මෙතෙක් සොයා ගෙන ඇති ශිෂ්ටාචාරයන් තුළින් හා වේදසාහිත්‍යාගත කරුණුවලින් සෑහෙන දුරකට ප්‍රකල්පනය කළ හැකි කරුණු නැත්තේ නො වේ. ක්‍රි. පූ. 2500 පමණ කාලයට අයත් යැයි සලකන ඉන්දු නිම්න ශිෂ්ටාචාරය අනාවරණයවීමෙන් පසුව ඒ යුගයේ සිටි මිනිසුන්ගේ සිතුම් පැතුම් ක්‍රියාවලිය ආගමික චින්තාවන්ගේ ප්‍රභවයට තුඩු දෙන අයුරින් ක්‍රමයෙන් විකාශනය වූ අයුරු පෙනේ.

මේ යුගයේ දී සොයා ගෙන ඇති නටබුන් අනුව ආදිකාලීනයා මුලින් ම සශ්‍රීකත්වයේ මූලධර්මය වශයෙන් සලකනු ලැබූ, සකල ජීවිතයේ ම ගුප්ත ප්‍රභවස්ථානය ලෙස සලකනු ලැබූ පෘථිවිය මවක ලෙසින් සැලකුම් ලැබීමට පටන් ගැන්ම නිසා මව් දෙවඟන හෙවත් ජගන්මාතා වන්දනාව බිහි වූ බව කියැවෙයි.[1] ජගන්මාතාව පිදීම හැරුණු විට දෙවියකු පුදනු ලැබූ බව ද පෙනේ. මොහු ශිව දෙවියාගේ පූර්වරූපය-කැයි ද සිතිය හැකි 'ශිව ත්‍රිමුඛ' නම් මුහුණු තුනක් ඇති මහ ශිව දෙවියා යනුවෙන් හැඳින්වෙන්නෙකි.[2] එසේම වෘක්ෂ වන්දනාව නාගවන්දනාව, මත්ස්‍යවන්දනාව ආදිය ද කළ බව පෙනේ. මේ ඇදහීම් තුළින් පෙනෙන්නේ එකල සිටි ජනතාව තුළ ආගමික චින්තාවන් ක්‍රමික ව වර්ධනය වෙමින් තිබුණු බව යි.

ඊට පසු ව ආගමික චින්තාවන්ගේ පසුතලය සොයන්නෙකුට බෙහෙවින් උපකාරී වන්නේ වේදසාහිත්‍යය යි. වේදසාහිත්‍යාගත කරුණු අනුව යාග හෝමාදියෙහි දී ගැයීම සඳහා යොදා ගන්නා ලද ගී වලින් ද, මනඃකල්පිත ව ඇති කර ගත් දෙවිවරුන් පිළිබඳ වර්ණනා මුඛයෙන් රචිත ගීත ස්තොත්‍ර ආදියෙන් ද පෙර විසූ ජනයාගේ ආගමික චින්තාවන්, ක්‍රමික ව විකාශනයට පත් වූ අයුරු දැන ගත හැකිය. මේ යුගයෙහි ආර්යවර්ගයාගේ එක ම බලාපොරොත්තුව වූයේ පරලොව සම්පත් විඳීමට වඩා මෙලොව සම්පත් ලබා ගැනීම සඳහා ක්‍රියා කිරීම යි. ඒවා සඵල කර ගැනීමට ඔවුන්ට උපකාරී වූයේ ස්වාභාවික වස්තූන් ය. මේ නිසා තමාට දෛනික ජීවිතයේ දී හමු වූ හිරු - ගින්න-වැස්ස - සුළඟ-පොළොව ආදි ස්වාභාවික වස්තූන් දෙවියන් ලෙස සලකා තමන්ගේ සිතැඟි තෘප්තිමත් කර ගැනීමට එම කල්පිත දෙවිවරුන් ගෙන් අයැද සිටියහ. ඉන්පසු මිනිසාට සමාන චිත්ත සන්තාන යක් දෙවිවරුන්ට ද ඇති බව කල්පනා කොට ලෞකික ජීවිතය තෘප්තිමත් කර ගැනීමට අවශ්‍ය වූ ආහාරපානාදි සියලු දේ කිසිදු හිරිහැරයක් නැතිව ලබා ගැනීමට හැකි වූයේ ස්වභාවධර්මය අරක් ගෙන සිටි

ඒ දේවතාවන්ගේ අනුකම්පාව හා අනුග්‍රහය නිසා යැයි සිතූ ඔවුහු ආහාරයෙන් ඔවුන් සන්තර්පණය කිරීමට ආගමික පුද පූජා ආරම්භ කළහ. නොයෙක් පූජාවිධි ගෞරව යෙන් හා භක්තියෙන් සිදු කළේ තමන්ට නොයෙක් දේ ලබා ගැනීමේ අභිලාෂයෙන් බව 'දෙවියනි, මම ඔබට පුදමි. එහෙයින් මට සුබ සෙත සලසන්න' යන ඍග්වේද පාඨානුපාදයෙන් පැහැදිලි වේ.[3] මෙසේ ක්‍රමික ව ඔවුන්ගේ දේවවිශ්වාසයක් හට. ගත් ආකාරය තිලකසිරි මහතා මෙසේ කියයි.

'වෛදික සූක්තයන්හි සිය හැඟීම් පවසන ඍෂිවරුන් පළමු ව යැද්දේ ඉරු දෙවියන්ට වත් සඳු දෙවියන්ට වත් ගිනි දෙවියන්ටවත් වෙන දෙවිවරුන්ට වත් නො වේ. ස්වභාව ධර්මයේ අංග වන දවස් පතා නැග එන සූර්යයාට ද රාත්‍රියෙහි රශ්වලින් ලොව නහවන චන්ද්‍රයාට ද අහසෙහි සමහර විට බැබළෙන විදුලි එළියට ද මිහිපිට නිතර ම දැල්වෙන ගිනිදැල්වලට ද එසේ ම ඇසට පෙනෙන වෙනත් නොයෙක් ස්වාභාවික වස්තූන්ට ද වේ.[4]'

ස්වභාවධර්මයෙන් වසින වර්ෂාවට දේවත්වය ආරෝපණය කළ අයුරුත් ඒ ස්වභාවධර්මයේත් දෙවියන්ගේත් අතර තිබුණු සබඳකම ගැන ඔවුන් සිතූ අයුරුත් ඍග් වේදයේ එනුයේ මේ අයුරිනි.

> "අභි ක්‍රන්ද ස්තනය ගර්භමාධා
> උදන්වතා පරිදීයා රථෙන
> දෘතිං සුකර්ෂ විෂිතං න්‍යඤ්චං
> සමාභවන්තු ද්විතො නිපාදඃ[5]"

(දිය පිරුණු රථයෙන් අප වෙත එනු මැනවි. ලිහන ලද දෘතිය පහළට අදිනු මැනවි. (පෘථිවිසෙහි) උස් පහත් තැන් එක සමාන වේවා.)

**බහු දේව වාදයෙන් එක දේව වාදයට**

දෙවියන් පිළිබඳ ව වෛදික ජනයා දරූ මත හා අදහස් ක්‍රමයෙන් දියුණු තියුණු වී බහුදේවවාද යට ද (Polytheism) ඉන්පසු ඒ දෙවිවරුන් සියලු දෙනා ම පාලනය කරන එක් බලගතු දෙවියකු වෙතැයි කල්පනාකරමින් ඒක දේවවාදයට ද (Monot heism) ඔවුන්ගේ චින්තන මාර්ගය නැඹුරු විය.[6] මෙසේ දෙවියන් යැදීමෙන් ස්වභාවධර්මයාගේ අනුග්‍රහය ලැබෙතැයි විශ්වාස කළ ඔවුන්ට කෙසේ හෝ සුඛොප භෝගී ජීවිතයක් ද ගත කිරීමට හැකි විය. කල් යත්ම විවේකී ජීවිතයක් ගත කිරීමට අවස්ථාවක් ලද ඔවුන් මිනිසාගේ ජීවිත විනාශය ප්‍රත්‍යක්ෂයෙන් දත් හෙයින් පර ලොවක් ගැන ද ක්‍රමයෙන් සිතන්නට පුරුදු වූහ. කෙසේ නමුත් මරණයෙන් මතු මිනිසා ගේ අවසානය නො වන බව දැන සිටි හෙයින් ඔවුහු කිසියම් ආත්මභාවයක් පළිබඳ විශ්වාසයක් ද තැබූහ. මරණින් පසු ලබන එම ආත්මභාවය සැපවත් කර ගැනීමට කුසලකර්මයන් කළ යුතු බවත් පාපකර්මයන්හි නිරත වුවොත් කිසි දිනක ගොඩට ආ නොහැකි අන්ධකාර ප්‍රපාතයකට වරුණ දෙවියන් විසින් හෙළනු ලබන බවත්[7] ඔවුහු විශ්වාස කළහ. වෛදික යුගයේ ආර්ය ජනයාගේ ආගමික චින්තා වන් සැකසී ක්‍රමයෙන් දියුණු තියුණු ව ආ හැටි එයින් පෙනේ.

සමස්තයක් වශයෙන් ගෙන ලෝකයේ නොයෙක් තැන විසිරී ඇති සෑම ආගමික සංකල්පයක් දෙස ම විචාරාක්ෂිය යොමුකර බලන විට පෙනී යන්නේ එම චින්තාවන්ගේ ආකෘතිය ගොඩ නැඟී ඇත්තේ මිනිසාගේ භාව විෂයක ජීවිතය වටා වූ පදනමක් මත බව ය. නොයෙක් විධියේ කාල්පනික ශක්තීන් ඇසුරින් ගොඩ නැගුණු දෙව සංකල්පයනුත්, මිථ්‍යාවිශ්වාසයනුත් මේ ආගමික චින්තාවන්ගේ ප්‍රභවයට මූලික හේතුව වූ බව පෙනේ. ප්‍රාග්වෛදික යුගයේ දී ත් ඊට පසුවත් බිය ජනක මෙඝ ගර්ජනා හා විදුලි කෙටීම්, සුළි සුළං, ජල ගැලීම්, ආදිය පිළිබඳ ව මිනිසා තුළ ඇති වූයේ

අසීමිත භයකි. එයින් තමාට නැතහොත් මම යන පුද්ගලයාට කරදරයක් - පීඩාවක් වෙයි ද? යනු ඔහු තුළ හට ගත් සිතුවිල්ලක් බව පෙනේ. 'ප්‍රාකෘතික මිනිසා ස්වාභාවිකත්වය කෙරෙහි දැක්වූ බිය නිසා ආගමේ සම්භවය සිදු විය.'' යි රෝම දර්ශනිකයකු වූ ලුක්රේෂියස් විසින් ද දක්වා ඇත.[8] ටයිලර් එඩ්වඩ් නම් දර්ශනිකයා ද මේ මතය ම අනුමත කරමින් 'ස්වභාව ධර්මයේ සෑම අංගයක් ම අරක් ගෙන සිටින ආත්මයන් වෙත ප්‍රකෘති මිනිසා තුළ වූ බිය ඔස්සේ ආගම පහළ වූ බැව්[9] ප්‍රකාශ කර ඇත. එමෙන් ම ප්‍රේත සංකල්පය (මියගිය අය පිළිබඳ විශ්වාස) වෛදික යුගයේ සිට ක්‍රමික විකාශයට පත් වූවකි. තත්කාලීනයා තුළ තිබුණු මුතුන් මිත්තන් හා භූතයන් කෙරෙහි දැක්වූ බිය නිසා ආගමික සංකල්පයන් බිහි වූ බව ස්පෙන්සර් නමැති දර්ශනිකයා කල්පනා කළේ ය.[10]

වේද සාහිත්‍යග්‍රන්ථයන්හි එන දේවසංකල්පයටත් අනිකුත් ස්වාභාවිකත්වයවන්දනා කිරීම, මුතුන් මිත්තන් පිදීම, සත්වවන්දනාව යනාදියටත් මූලික හේතුව මිනිසා තුළ පැවතුණ ආත්මභය වටා ගෙතුණ භය සංකල්පය යි. එහෙයින් මෙම ආත්මභය වටා ගෙතුණ භය සංකල්පය ආගමික චින්තාවන්ගේ ප්‍රභවයට හේතු වී යැයි අපට නිගමනය කළ හැක. මේ බිය මත චින්තන ධාරාවන් ගොඩ නැඟූ මිනිසා තමාට නො පෙනෙන සුලු කිසියම් ගුප්ත බලවේගයක් ඇති බවත් එයින් සියල්ල මෙහෙයන බවත් කල්පනා කොට එම ස්වාභාවික බලවේගයන්ට පුද්ගලත්වාරෝපණය කිරීමත් මනුෂ්‍යාත්වය ඉක්මවූ බලවේගයන් පිළිබඳ ව විශ්වාස කිරීමත් කෙළේ ය. මෙම මානුෂීය බලවේගයන් තම පාලනයට ගත හැකි වුව ද ඒවා සමග සහයෝගයෙන් කටයුතු කරන්නේ නම් ස්වභාවධර්මයෙන් තමාට ඇතිවන හිරිහැර - කරදර - විපත් මග හරවා ගත හැකි බව මිනිසා සිතීමට පටන් ගත්තේ ය.

විවිධ සභ්‍යත්වයන්හි පැවති ආගමික චින්තාවන් සංකල්පයන් හා සම්ප්‍රදායයන් අතර එම සභ්‍යත්වයන් බිහි වූ ප්‍රදේශවල වාතාවරණයන් විසින් හැඩගස්වනු ලැබීම නිසා නොයෙකුත් වෙනස්කම් හා ඒවාට ආවේණික ඇතැම් ලක්ෂණ දක්නට ඇති බැව් සත්‍යයක් වුව ද ඒ සියල්ල යටින් දිවෙන එක්තරා ඒකීයත්වයක් පවත්නා බැව් ආගමික චින්තාවන්ගේ සම්භවය ගැන කරුණු විමර්ශනය කිරීමේ දී පැහැදිලි ව පෙනෙන සත්‍යයකි. මෙම කරුණින් සියුම් ව අපට නිගමනය කළ හැක්කේ එක් පැරණි සභ්‍යත්වයක ආගම තවත් එවැනි සභ්‍යත්වයක ආගමකින් සම්පූර්ණයෙන් වෙන් කොට දැක්විය හැකි පැහැදිලි බෙදුම් ඛණ්ඩයක් නො මැති බැව් හුවා දක්වන්නක් බව සිතේ.

### ආගමෙන් විද්‍යාවත් විද්‍යාවෙන් දර්ශනයත් පහළ වෙයි.

දර්ශනයේ සම්භවය පිළිබඳ කරුණු සෙවීමේ දී මිනිසාගේ බුද්ධිය ක්‍රමයෙන් විකාශනයට පත් වූ අවධියේ සිට කරුණු සලකා බැලියයුතු ව ඇත. දර්ශනය චින්තනයේ ප්‍රතිඵලයක තාත්විකත්වයක් වන හෙයිනි. එහෙත් එහි ක්‍රමික විකාශයක් ඉදිරිපත් කිරීමට දැනට අප හමුව ඇත්තේ පුරා විද්‍යාත්මක හා ඓතිහාසික කරුණු ඉතා ස්වල්පයකි. ක්‍රි. පූ. 5000 ට පෙර ලෝකයේ කිසිම තැනක සභ්‍යත්වයක් තිබුණ බවට විද්‍යාත්මක පර්යේෂණයන් මගින් මෙතෙක් සාධක හෙළිකර නැත. මෙතෙක් හමුවී ඇති පැරණි ම ශිෂ්ටාචාරයන් දෙස බලන විට පෙනෙනුයේ ආදිම ජනතාවගේ ආගමික චින්තනයන් හා දර්ශනික සංකල්පයන් දේවකථාවන් ඇසුරෙන් ගොඩ නැඟී ඇති බව යි. මේ අනුව කරුණු පරීක්ෂාකිරීමේ දී වෛදකාලයට පූර්වයුගයෙහි කරුණු දැන ගැනීමට මානව විද්‍යාත්මක හා පුරාවිද්‍යාත්මක සොයා ගැනීම් ඉවහල් කර ගතයුතු බව පෙනේ. පැරණි තම අවධියේ මිනිසා ගිනි දල්වා ගැනීමටත් ගල් සතුරු

වලින් අවි ආයුධ තනා ගැනීමටත්, ගෙවල් තැනීමටත්, රෙදි පිළි විවීමටත් දන සිටිය බව පුරාවිද්‍යාත්මක සාධකයන්ගෙන් ඔප්පු වේ. ඒ සමග ම ඔවුන් තුළ වෛද්‍ය කර්‍මයත් නක්ෂත්‍රයත් දෛවවිද්‍යාවත් දියුණුව පැවති බව මානව විද්‍යාඥයෝ ද පුරා විද්‍යාඥයෝ ද කල්පනා කරති. කෘෂිකාර්මික, වාණිජ හා සතුන් ඇති කිරීම වැනි දියුණු ආර්ථික පදනමක් තිබූ ඒ පැරණි ශිෂ්ටාචාර තුළ ආගමික දියුණුවක් ද තිබුණි. දෙවියකු අරක් ගත් ගසක් මුල භාජනයක් අතින් ගත් මිනිසකුගේ මුද්‍රාවක් ඉන්දු නිම්නයෙන් සොයා ගෙන ඇත.[12] මෙය දේවපූජාව ඔවුන් අතර සිරිතක්ව තිබුණු බවට සාධකයකි. එපමණක් නොව ඊශ්වර යැයි සිතිය හැකි දෙවියා වටා සතුන්ගේ රූප ඇති පිළිරුවක් ඇති මුද්‍රාවක් සොයා ගනු ලැබ ඇත.[13] මෙය ද ආගමික විශ්වාසයන් අතර එන සත්ව වන්දනාව පිළිබිඹු කරන්නකි. මෙසේ සමාජය තුළ ශිල්පශාස්ත්‍රඥනයත් ආගමික ප්‍රතිපත්තික්‍රමත් දියුණුවීමෙන් පසු විද්‍යාඥනය පහළ වූ බව විචාරකයන්ගේ මතයි. කරුණු මෙසේ වුවත් මෙබඳු සමාජීය වාතාවරණයක් තුළින් දර්ශනයක් එක්වර පහළ වූයේ නැත. දර්ශනයක් පහළවීමට නම් මිනිසාගේ ඥානය දියුණු විය යුතු ය. එම ඥානය ඔවුන් දියුණු කර ගත්තේ බාහිර ලෝකයේ ඔවුන්ට දක්නට ලැබෙන විදුලිය, මේඝගර්ජනය, අසනිප්‍රහාර යනාදි අදෘශ්‍යමාන බලවේගයන් පිළිබඳ චින්තනයෙනි. මෙම බලවේගයන්ට දේවසංකල්පය ආරෝපණය කොට ආගමික විශ්වාසයන් තුළින් විද්‍යාඥානයත් එයින් දර්ශනඥානයත් පහළවූ බව මෙතෙක් දක්නට ලැබෙන කරුණු අනුව විචාරකයන්ගේ පිළිගැනීම යි.

ඊට පසු යුගයෙහි දී අපට හමුවන වේද සාහිත්‍යාගත කරුණු පිළිබඳ ව සමීක්ෂණය කිරීමේ දී මෙම දර්ශනික චින්තාවන්ගේ ප්‍රභවයට තුඩු දෙන කරුණු ස්වල්පයක් සොයා ගත හැකි ව පවතී. වෛදික සෘෂින් පළමු ව යාග කොට ඇත්තේ ස්වභාව ධර්මයේ අංගයන්ට බව පෙර දී දක්වීමු. එමෙන් ම සෘග් වෙද යුගයේ දී දේව වර්ණනයට ඇතුළත් වන සෝම-අග්නි-වායු-පෘථුවි-උෂස් යන දෙවි දේවතාවුනුත් ඉන් පසු කලෙක රුද්‍ර-මරුත් සහ පර්ජන්‍යත් ආර්යයෝ ඇදහීමට පටන් ගත්හ. මෙසේ ස්වභාව ධර්මයේ ක්‍රියාකාරිත්වය යම් කිසි ක්‍රමයක් හෝ නියාමයක් අනුව සිදුවන බව වෛදික ජනයා විසින් ඡායාමාත්‍රයකින් වත් වටහා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ස්වභාවධර්මය අරක් ගත් දෙවියන් ගැන විශ්වාසය ඔවුන් අතර ඇති වී යැයි[14] හිරියානා මහතා කල්පනා කරයි. වෛදිකයන් අතර එන නියාම ධර්මය පිළිබඳ කරන ලද මෙම විශ්වාසය දර්ශනයේ ඉතා උසස් දියුණුවක් ලෙස සැලකිය හැක්කේ බෞද්ධ දර්ශනයේ දී පවා බුදු රජාණන් වහන්සේ විසින් ධර්මතාවන් ගැන කරුණු ඉදිරිපත් කර ඇති හෙයිනි.[15] කල් යත්ම යථෝක්ත වස්තූන්ට දේවත්වය ආරෝපණය කිරීමත් දර්ශනික අදහස් ගැබ් වූ විශ්ව කර්ම (ලෝකය මවන්නා) පජාපති (ප්‍රජාවේ නායකයා) ධාතෘ, මන්‍යු, අනුමතී ආදි මානසික හෙවත් විඥානමය වස්තූන් මුල් කර ගත් දෙවිවරුන් කීප දෙනකුත් අදහන්නට වූහ. මෙයේ ක්‍රමයෙන් විශ්වයේ පාලන කටයුතු කිරීම පිණිස දෙවිදේවතාවරුන් සමූහයක් දක්වා අනතුරුව විශ්වකර්‍ම නම් එක දෙවියකු අදහන්නට වීමත් විස්මය ජනක වස්තූන් කෙරෙහි ඇති කර ගත් දර්ශනික චින්තාවන්ගේ විකාශනයෙහි ප්‍රතිඵලයෙකි.

ආගමික සංකල්පයන් දියුණු වෙමින් පෘථුල වෙමින් කාලයත් සමග ඉදිරියට යත් ම උග්‍ර කුලවාදයේ ප්‍රතිඵලයක් වශයෙන් ලෝකයාගේ විචාරාක්ෂිය යාග හෝම පුද පූජා විෂයෙහි යොමුවන්නට විය. ආරණ්‍යක යුගයේ දි බාහිර යාග විධීන් උපයෝගි කර ගෙන ආගමික පරමාර්ථ සෙවීම

නිෂ්ඵල ක්‍රියාවකැයි තේරුම් ගත් මෙකල විසූ චින්තකයන් භාවනානුයෝගී ව අභ්‍යන්තරික ඥානයෙන් ආත්ම තත්ත්වය ප්‍රත්‍යක්ෂ කර ගැනීමට උත්සාහ කළ බව පෙනේ. මේ දර්ශන වාදයන්ගේ මාර්ගයෙන් තත්ව ඥානය ලබා ගැනීමේ අවශ්‍යතාව කෙරෙහි මිනිස් සිත ක්‍රියා කිරීමෙන් හටගත් විප්ලවය භාරතීය දර්ශනයේ සම්භවයට ශ්‍රෙෂ්ඨතම රුකුලක් වූ බව පෙනේ. විශේෂයෙන් ම ආගමික කෘත්‍යයන්හි මුල් තැන ගෙන තිබුණු යාගය (කර්ම මාර්ගය) ඥාන මාර්ගයට වැටීම ද මෙයට හේතුවිණි. මින් පිබිදුණු බුද්ධිමත් පිරිස යාගයෙන් ලැබුණේ ස්වර්ග සම්පත් මිස විමුක්ති සම්පත නො වේ යැයි තීරණය කළහ. මෙසේ යාගයෙහි අවශ්‍යතාව අඩු වී යැමත් සමග මුළු සමාජය ම දර්ශනික පක්ෂය කෙරෙහි නැඹුරුවීමට තුඩු දුන් බුද්ධි විප්ලවයකට පියවර තැබූහ. ප්‍රාග් වෛදික යුගයේ සිටි ඍග් - යජුර් - සාමන් අථර්වන් යන චතුර්වේදයන්හිත් බ්‍රාහ්මණ-ආරණ්‍යක-උපනිෂද් යන යුගවල දීත් ආගමික දර්ශනික අදහස් ක්‍රමික ව විකාශනයට පත්ව බෞද්ධ භාරතීය ආගමික පසුතලය සකස් ව ඇත. ඉන් පසු එම ආගමික පසුතලයෙන් පැන නැඟුණු බෞඪ දර්ශනය අනෙක් සියලු ම දර්ශනයන් අබිබවා නැගී සිටි බව පෙනේ.

---

1. Myers, Cambridge. Ancient History Vol I
2. ඉන්දු ලංකා බෞද්ධ සංස්කෘතිය. 196 – 197 පිටු.
3. ඍග්වේදය 1 මණ්ඩලය. 41 සූක්තය.
4. වෛදික සාහිත්‍යය (4 පිටුව) : ජේ. තිලකසිරි
5. ඍග්: v. 83 – 7
6. භාරතීය දර්ශන ඉතිහාසය (14 – 16 පිටු) ජිනදාස කළුපහන
7. ඍග්: vi 5. 5.
8. De Rerum Natura.
9. Primitive Culture.
10. Prm of Sociology - Spencer.
11. ඉතිහාස ශික්ෂා: අංක 14, පිටුව 40
12. එම පිටු 47
13. එම පිටු 48
14. Outline of Jndian Philosophy P. 31 Hisiyan
15. දිඝනිකාය මහාපදන සුත්ත: ''අයං එසා ධම්මතා,' ''ධම්මතා එසා'යි සඳහන් වේ.

'නා චින්තයන්තො පුරිසො විසෙස'මධිගච්ඡති'
නොසිතන මිනිස් තෙම අමුතු දියුණට අභිමියි.